# 25

# පුද්ගලානුබද්ධ අත්දැකීම් නිර්මාණකරණය සඳහා උපයෝගී වන ආකාරය (ඕගස්ට් ස්ට්‍රින්ඩ්බර්ග්ගේ පීතෘ නාට්‍යය ඇසුරින්)

*නිමල් අබේසූරිය, ආර්. ඩී.*[1]
*සරණකිත්ති හිමි, බෙරලිහෙළ*[2]

මෙම අධ්‍යයනයෙන් අප අපේක්ෂා කරන්නේ පුද්ගලානුබද්ධ අත්දැකීම් නිර්මාණකරණය සඳහා උපයෝගී වන ආකාරය ඕගස්ට් ස්ට්‍රින්ඩ්බර්ග්ගේ පීතෘ නාට්‍යය (1887) ඇසුරෙන් විමසීමටයි. ස්වීඩන් ජාතික ඕගස්ට් ස්ට්‍රින්ඩ්බර්ග් මේ සඳහා විශේෂයෙන් තෝරා ගන්නේ ඔහු කුඩා කල සිට විඳි ජීවිත අත්දැකීම් ඍජු ව ම නාට්‍ය නිර්මාණ ඔස්සේ ඉදිරිපත් කළ බැවිනි. එසේ ම ඒවා කොතෙක් දුරට නාට්‍යකරණය සඳහා දායක වූවා ද යන්නත් විමසීම මෙහි අරමුණයි. අධ්‍යයනයේ ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ස්ට්‍රින්ඩ්බර්ග්ගේ 'ද ෆාදර්' නාට්‍යයෙහි ප්‍රේමරංජිත් තිලකරත්න විසින් 'පීතෘ' නමින් කළ පරිවර්තනය යොදා ගැනෙයි. ද්විතීයික මූලාශ්‍රය වශයෙන් අත්දැකීම හා නිර්මාණකරණය පිළිබඳ ලියැවී ඇති ග්‍රන්ථත්, තෘතීයික මූලාශ්‍රය වශයෙන් අන්තර්ජාලයෙන් ලබා ගත් ලිපිත් භාවිත වේ. එසේ භාවිත කරමින් පුද්ගලානුබද්ධ අත්දැකීම් නිර්මාණකරණය සඳහා උපයෝගී කර ගන්නා ආකාරය විමර්ශනය කෙරෙයි.

ප්‍රමුඛ පදඃ ස්ට්‍රින්ඩ්බර්ග්, පීතෘ, අත්දැකීම, නාට්‍යකරණය, පුද්ගලානුබද්ධ අත්දැකීම්

---

*1 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය.*
*2 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය.*